*මල් වැරෑ ගසක යළි පීදෙනා ළපළු තුටු*
*නිම වනා හදක පිරි කඳුළු දුක් සුසුම් පිදු*
*සැනහෙනා දිනෙක මතු ඉතිරෙනා තුසර බිඳු*
*පුරනවා සඳක සුදු නැළවෙනා දින සුමුදු*

0000000000000000000000

අනුරාධ පිබිදුණේ දොර සීනුව නාද වන හඬින් ය. රෑ නිදි වැරෑ බැවින් එක වර නැගිටින්නට ඔහුට නොහැකි විය. ඔහු නැගිට්ටේ දෙතුන් වතාවක් සීනුව නාද වූ පසුව ය. අනුරාධ අතින් විවෘත වූ දොරෙන් සුනෙත් ඇතුල් වූයේ ඔහුට බැණ වදිමිනි.

''අපි මෙහේ මූ වෙනුවෙන් මැරෙන්න හදනවා.. උඹ ඉතින් දවල් වෙනකල් හොඳට නිදාගනින්.''

''මොකද බං මේ උදේ පාන්දරම..?''

''උදේ පාන්දර... මොළේ හොඳ නැද්ද..? දැන් වෙලාව දවල් එකයි..'' සුනෙත් කොක් හඬ ලා සිනාසුණේ ය.

''මට ඊයෙ රෑ නින්ද ගියේ නෑ බං..''

''කල්පනා කර කර ඉන්න ඇති.. ආයෙ අහන්න දෙයක් නෑ.. දැන් ඉතින් ඔය කල්පනාව නවත්තපං.. ඔන්න මං උඹට සුබ-ාරංචියක් අරගෙන ආවා... ඔන්න මල්ලි ඔස්ට්‍රේලියාවට යන්න පොට පෑදිලා උඹට..''

''විහිලු කරන්න එපා බං..'' අනුරාධ විදුලි කේතලයට වතුර දමන අතර කීවේ ය.

''විහිලු නෙවෙයි.. මල්වැස්ස ෆිල්ම් එක ඔස්ට්‍රේලියාවට යනවා..''

''ඉතින්..''

''ප්‍රොඩියුසර් කාරයා මනීෂා එක්ක ඒකට යන්නයි ප්ලෑන් කළේ... මං මිනිහා එක්ක කතා කරලා ප්‍රධාන නලුවා හැටියට උඹටත් ඒ එක්කම යන්න වැඩේ සෙට් කළා.. මේවා මල්ලි සෑහෙන අය කරන්න ඕනෙ වැඩ.. ඒත් ඉතින් මං ගෙවන ක්‍රමේට කරන්නං.. ''

''උඹ නං දෙයියෙක් මල්ලි..'' අනුරාධ සුනෙත් වැළඳ ගත්තේ මහත් සතුටකිනි.

''දෙයියෙක් නෙවෙයි බං.. මිනිහෙකුගෙයි ගෑනියෙකුගෙයි ආදරේ තේරුම් ගන්න පුලුවන් මිනිහෙක්..''

0000

නිෂාධි නිවසෙන් එළියට බැස්සේ අරමුණකින් තොරවය. දුරකතන ඇමතුමක් දී ගෙන්වා ගත් කුලී රියට නගින විටත් යන්නේ කොහේදැයි ඇය තීරණයකට පැමිණ නොතිබුණි.

''ෆ්ලින්ඩර්ස් ස්ට්‍රීට්..'' ඇය රියදුරාට කීවා ය. කිසිවකු හමුව කතා කර සිය හිත සැහැල්ලු කර ගන්නට ඇයට අවශයව තිබුණි. ගෙදරට කොටු වී ගත කළ දින කීපය ඇයට මහත් පීඩාවක් විය. උදාරි හමුවන්නට ඇත්නම් මැනැවැයි ඇයට සිතුණේ කුලී රිය බොහෝ දුරක් ගියාට ද පසුව ය. සිය ජංගම දුරකතනයෙන් උදාරි ඇමතූ නිෂාධි ඇය නිවසේ සිටිනා බව තහවුරු කර ගත්තා ය.

''අපි මිල්පාක් වලට යමු...'' නිෂාධි කීවා ය. පසුපස බලන කණ්නාඩියෙන් ඇය දෙස බැලූ රියැදුරා හිස වනා එකඟතාව පළ කළේ ය.

තමා තනිවම ගමනක් යන්නේ අවුරුදු කීයකට පසුවදැයි නිෂාධි කල්පනා කළා ය. ඈ නිවසින් පිටව ගියේ කලාතුරකිනි. එසේ පිටව ගිය ද ඒ සෑම ගමනකටම දිලීප ද පැමිණියේ ඇයට වදයක් වන තරමට ය. දිලීප තමාට ලැබිය යුතු ගෞරවය කිසි දිනෙක තමාට පුද නොකළ සැමියකු බව දැන් නිෂාධිට සිතෙයි. ඔහු කිසි දිනෙක තමා විශ්වාස නොකළ බව නිෂාධිට දැන් පැහැදිලි ය. ඉඳිකටුව පසු පස යන නූලක් සේ ඔහු තමා පසුපස යන යන තැනට ආවේ ආදරය නිසා නොවන බව ඇයට සිතෙයි. ඒ ඉරිසියාව මිස ආදරය නොවේ. සිත මේ තරම් ඔහුගෙන් බිඳී යන්නට හේතුව ඒ අවිශ්වාසය ම නොවේ ද?

මෙතුවක් කාලයක් තමාට මේ කිසිවක් නොවැටහුණු අරුමය ඇයට තේරුම් ගත නොහැකි ය. තමා වැටී සිටියේ විහාල මුළාවක නොවේ දැයි සිතෙන විට ඇගේ සිතේ ඇති වන්නේ මහත් වේදනාවකි. දිලීප ගේ මේ රළු පැවැත්මත් අනුරාධගේ මල් පෙත්තක් මෙන් සියුමැළි ආදරයත් අතර ඇත්තේ අහස හා



පොළොව මෙන් වන සුවිශාල පරතරයක් නොවේද..? ජීවත් විය යුත්තේ ආදරය වෙනුවෙන් නොවේ ද?

අනුරාධ.. ඔහු ළඟ සිටින විට දැනෙන සැහැල්ලුව කොයි තරම් ද? ඔහු පුළුන් රොදක් සේ සැහැල්ලු ය. ඒ සුවදායක හැඟීම අසළ සිත නැවතීම පුදුමයක් ද?

*සොඳුරු කවක්මැයි*
*නුඹේ සෙනෙහස*
*සිතට සැනසුම් ගේනා*
*අසනි වැසි මැද*
*වැටුණු දිවියට*
*සිසිළ සොම්නස පුරනා*
*සිළිඳු පලසකි*
*පයට මුදු සුව*
*සේම සිත පොබ කරනා*
*කුමරු නුඹමය*
*කප්පරක් කල්*
*මහද සිතුවම් අඳිනා*

''මට ඒක හොඳටම තේරුම් ගන්න පුලුවන්.. '' උදාරි කීවා ය. ''.. උඹ හිතුවෙ මාත් අර සම්ප්‍රදායික හැඟීම් තියෙන මනුස්ස දුවක් කියල ද..? නෑ බං. මට එයිට වඩා පුළුල් විදිහට ලෝකෙ දකින්න පුලුවන්..''

නිෂාධිගේ ඇස් කඳුළින් තෙත් වනු උදාරි දුටුවා ය.

''අපි වගේ නෙවෙයි... උඹ මලක් වගේ සියුමැළියි.. ඒ සියුමැළි කම දුර්වල කමක් විදිහට දිලීප තේරුම් ගන්න ඇති..''

34 වන පිටට

